දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

මගේ අංකය / எமது இல. / My No. } ED/03/40/1/1/5

දිනය / திகதி / Date } 2014.04.04

චක්‍රලේඛ අංක : 04/2014

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම රජයේ හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම පරිවේණාධිපතිවරුන්

**<u>ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය හා රජය පිළිගත් වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල දේශීය පාඨමාලාවන් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම</u>**

උක්ත මැයෙන් 2013.06.07 දාතමින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 26/2013 කෙරේ ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 4 වැනි වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

**4. සති අන්ත පාඨමාලා සඳහා ලබා දෙන රාජකාරි නිවාඩු**

4.1. සති අන්ත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරණ නිලධාරින්/ගුරුවරුන් සඳහා පමණක් සහභාගීත්වය තහවුරු කිරීමෙන් අනතුරුව එම පාඨමාලාව පැවැත්වෙන සති අන්තවල පෙර දින වන සිකුරාදා හෝ පසු දින වන සඳුදා හෝ යන දින දෙකින් එක් දිනකට රාජකාරි නිවාඩුවක් ලබා ගත හැකි ය.

4.2. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැර අනෙකුත් අධ්‍යයන පාඨමාලාවන් සඳහා සති අන්තයේ සහභාගීවන්නන්ට සේවා ස්ථානයේ සිට අධ්‍යයන මධ්‍යස්ථානයට ඇති දුර කි.මී. පනහට (50) වැඩිවන අවස්ථාවලදී එම නිලධාරින්/ ගුරුවරුන් සඳහා සති අන්තයට පෙර දින වන සිකුරාදා හෝ පසු දින වන සඳුදා වශයෙන් දින එකක (01) රාජකාරි නිවාඩුවක් සහභාගීත්වය තහවුරු කිරීමෙන් අනතුරුව ලබා ගත හැකි ය.

4.3. ඉහත 4.1 හා 4.2 හි පරිදි නිවාඩු ලබා ගැනීම සඳහා වන හිමිකම ලබා ගැනීමට සති අන්තයේ සෙනසුරාදා හා ඉරිදා යන දින දෙකම පාඨමාලාව සඳහා සහභාගී වී තිබිය යුතු ය. පාඨමාලාව පැවැත්වෙන්නේ සති අන්තයේ එක් දිනක් පමණක් නම් හෝ පාඨමාලාව සඳහා සහභාගී වී ඇත්තේ සති අන්තයේ එක් දිනක් සඳහා පමණක් නම් ඉහත නිවාඩුව හිමි නොවේ.

4.4. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරනු ලබන, තම සේවා ස්ථානය පාසලක් නොවන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට එම පාඨමාලාවේ ප්‍රායෝගික ඉගැන්වීම් අදියර සඳහා සති දහයක (10) උපරිමයකට යටත්ව අධ්‍යයන නිවාඩුවක් ලබාගත හැකිය.

ඉහත විධිවිධාන මෙම සංශෝධන චක්‍රලේඛය නිකුත්කල දින සිට බලපැවැත්වෙන අතර, ඒ අනුව අධ්‍යයන නිවාඩු/ රාජකාරි නිවාඩු ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

අනුර දිසානායක
අධ්‍යාපන ලේකම්

2014.04. 04

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය,
බත්තරමුල්ල

පිටපත්:

1. රජයේ අනුමත සියලුම විශ්වවිද්‍යාලය හා වෙනත් තෘතියික අධ්‍යාපන ආයතන
2. විගණකාධිපති
3. පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
6. ප්‍රධාන කොමසාරිස් ගුරු අධ්‍යාපන
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
8. ගණකාධිකාරිවරුන්
9. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
10. ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්